**ශීර්ෂය 213 - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය හා වාණිජ අත්තිකාරම් ගිණුම දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය213 - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝම්බර් 16 දින කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විභාග දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණ වලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.7 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේදී අනාවරණය වු පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණ වලට යටත්ව ගණන් දීමේ නිලධාරි වශයෙන් තම ගිණුම් කටයුතු භාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය. මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන වලට අනුකූලව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය ඉටු කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සාරාංශගත කර පහත සඳහන් සටහනේ දක්වා ඇත.

| මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ගණන්දීමේ නිලධාරී විසින් එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසාදීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන්යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබිම. | 1. ප්‍රසම්පාදන කටයුතු සැලැසුම් නොකිරිම/ ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරිම | 2.1 |
| | | 2. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරිම | 2.3 |
| 128(1) (ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | අනුකූල නොවිම් | 2.6 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඇ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | 1. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟ හිටි ණය ශේෂ | 2.4 |
| | | 2. වාණිජ අත්තිකාරම් ගිණුම්වල වූ අඩුපාඩු | 2.5 |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත් බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කර ගෙන යන බව | කළමණාකරන දුර්වලතා | 2.2 |

## 2.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

-------------------------------------------------------------------------

පිටිපන නව පෙළපොත් ගබඩා සංකීර්ණයේ A ගබඩාවේ වාකවුළු දැල් ගසා ආවරණය කිරීම සඳහා රු.2,571,814 ක් වැය කර තිබුණු අතර ඒ පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මෙම කාර්යය ඉටුකිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් ගොඩනැගිලි අංශය විසින් රු.5,666,453 ක ඉංජිනේරු ඇස්තමේන්තුවක් සකස්කර තිබුණු අතර අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ වරලත් ඉංජිනේරුවරයකු මගින් එම ඉංජිනේරු ඇස්තමේන්තුව රු.2,238,450 ක් ලෙස සංශෝධනය කර තිබුණි. පළමුවෙන් සකස් කළ ඉංජිනේරු ඇස්තමේන්තුවේ අමුද්‍රව්‍ය මිලට වඩා සංශෝධිත ඉංජිනේරු ඇස්තමේන්තුවේ අමුද්‍රව්‍ය මිලෙහි සියයට 15 ක වැඩිවීමක් නිරීක්ෂණය වූ අතර එකම කාලපරිච්ඡේදයක් තුළ සකස් කළ ඉංජිනේරු ඇස්තමේන්තු දෙකක අමුද්‍රව්‍ය මිලෙහි ප්‍රමාණාත්මක විචලතා නිසා ඉංජිනේරු ඇස්තමේන්තු සකස්කිරීමේ නිවැරදිතාවය පිළිබඳ විගණනයට ගැටළු සහගත විය.

(ආ) 2016 නොවැම්බර් 02 දින කොන්ත්‍රාත්තුව නිම කිරීමට සැලසුම් කර තිබුණද කොන්ත්‍රාත්තුව ආරම්භ කර තිබුණේ 2017 මාර්තු 31 දින බවද නිරීක්ෂණය විය.

## 2.2 කළමනාකරණ දුර්වලතා

---------------------------

**විද්‍යුත් පෙළපොත නිෂ්පාදනය කිරීම**

-----------------------------------------------

දැනුම කේන්ද්‍රීය පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන යටතේ 2016 සහ 2017 වර්ෂවලදී රු.මිලියන 50 බැගින් වූ ණය ප්‍රතිපාදන ලැබී තිබුණ අතර මෙම ව්‍යාපෘති ණය පදනම් කරගෙන සකස් කළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව විද්‍යුත් පෙළපොත් නිෂ්පාදනය සඳහා 2016 වර්ෂයේදී රු.මිලියන 24.5 ක්ද 2017 වර්ෂයේදී රු.මිලියන 25 ක්ද වශයෙන් ප්‍රතිපාදන වෙන්කරවාගෙන තිබුණි. 11 වසර සඳහා වූ විද්‍යාව විෂය පෙළපොත මෙලෙස විද්‍යුත් පෙළපොතක් ලෙස නිෂ්පාදනය කර පාසල් වලට ලබාදීමට සැලසුම්කර තිබුණු අතර ඒ පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 11 වසර විද්‍යාව විෂය සඳහා විද්‍යුත් පෙළපොතක් සකස් කළ යුතු බවට දෙපාර්තමේන්තුව විසින් තීරණය කර තිබුණද මෙම නව නිෂ්පාදනය ශ්‍රී ලංකාව වැනි රටක ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකිද යන්න පිළිබඳව සහ ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබුණු අතර විධිමත් සැලැස්මක් ද සකස් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශයේ දත්ත කළමනාකරණ ශාඛාව මගින් ලබාගත් තොරතුරුවලට අනුව ශ්‍රී ලංකාවේ 11 වසර දක්වා පංති පැවැත්වෙන පාසල් 702 ක පරිගණක භාවිතා නොකරන අතර පාසල් 1,350 ක පමණ එක් පරිගණකයක් හෝ පරිගණක 02 ක් පමණක් ඇතිබවත් හඳුනාගෙන තිබුණි. මේ අනුව පරිගණක භාවිතා නොකරන මෙම දුෂ්කර පළාත්වල පාසල් සිසුන්ට 11 වසර විද්‍යා විෂය සඳහා වූ විද්‍යුත් පෙළපොත භාවිතාකිරීමට ඇති අවස්ථාව නොලැබී යන බව නිරීක්ෂණය විය.

(ඇ) මෙම කාර්යය සඳහා ලංසු කැඳවීමේ කොන්දේසි පත්‍රිකාවේ 18.2 ඡේදය අනුව නියමිත දිනට විද්‍යුත් පෙළපොත සැපයීමට නොහැකිවීම මත ඇවර අලාභය ලෙස ප්‍රමාද වන සෑම දිනක් සඳහාම වටිනාකමින් සියයට 0.5 ක් බැගින් සැපයුම්කරුට ගෙවීමට ඇති බිල්පත්වලින් අඩුකරගත යුතු අතර එලෙස අඩුකරගත හැකි අලාභයේ උපරිමය කොන්ත්‍රාත් මුදලින් සියයට 30 කි. උපදේශක සමාගම සහ දෙපාර්තමේන්තුව අතර අත්සන් කරන ලද ගිවිසුමේ විශේෂ කොන්දේසි යටතේ දැක්වෙන 6.5 ඡේදය අනුව විද්‍යුත් පෙළපොත නිෂ්පාදනයට අදාළව සමාගම විසින් සකස් කළ යුතු අයිතමයන් (Deliverables) දෙපාර්තමේන්තුව වෙත භාරදිය යුතු දිනයන් නිශ්චිතව දක්වා තිබුණු නමුත් එම නියමිත දිනවල අදාළ අයිතම දෙපාර්තමේන්තුව වෙත භාරදී නොතිබුණි. එලෙස ප්‍රමාද වූ දිනයන් සඳහා රු.2,306,187 ක් වූ ඇවර අලාභ අයකරගැනීමකින් තොරව රු.7,687,290 ක් වූ මුළු මුදලම උපදේශක සමාගම වෙත ගෙවා තිබුණි.

(ඈ) දැනුම කේන්ද්‍රීය පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන යටතේ ණය ප්‍රතිපාදන වශයෙන් ලැබී ඇති මුදල් වෙනුවෙන් 2016 වර්ෂය සඳහා රු.1,882,653 ක ණය පොළියක්ද ගෙවා තිබුණි. මෙලෙස විශාල පොළියක් ගෙවමින් විදේශ ණය ප්‍රතිපාදන යටතේ ආරම්භ කරන ලද මෙම විද්‍යුත් පෙළ පොත 2018 සැප්තැම්බර් මස වන විටත් පාසල් වලට බෙදා හැරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 2.3 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 23.4 | 23.2 | 0.2 | 0.8 |
| | මූලධන | 54.9 | 49.7 | 5.2 | 9.4 |
| | **එකතුව** | **78.3** | **72.9** | **5.4** | **6.8** |
| 2014 | පුනරාවර්තන | 29.3 | 26.8 | 2.5 | 8.5 |
| | මූලධන | 80.8 | 54.2 | 26.6 | 32.9 |
| | **එකතුව** | **110.1** | **81** | **29.1** | **26.4** |
| 2015 | පුනරාවර්තන | 55.4 | 47.2 | 8.1 | 14.6 |
| | මූලධන | 55.9 | 49.4 | 6.5 | 11.6 |
| | **එකතුව** | **111.3** | **93.6** | **14.6** | **13.1** |
| 2016 | පුනරාවර්තන | 58.9 | 56.9 | 2 | 3.4 |
| | මූලධන | 94.3 | 48.3 | 46 | 48.8 |
| | **එකතුව** | **153.2** | **105.2** | **48** | **31.33** |
| 2017 | පුනරාවර්තන | 56.7 | 53.7 | 2.9 | 5.1 |
| | මූලධන | 83.5 | 39 | 44.5 | 53.3 |
| | **එකතුව** | **140.2** | **92.7** | **47.4** | **33.8** |

**විසර්ජන ගිණුම**

**සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමේදී අවශ්‍යතාවයන් හදුනා ගෙන නිශ්චිත සැලස්මක් යටතේ ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා මූලධන වැය විෂයයන් හතරකට ආදාලව සියයට 67 සිට සියයට 100 දක්වා පරාසයක රු.39,857,863 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

## 2.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවටඅදාළ විෂය අංක 21301යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 18 | 12.4 | 6.5 | 7 | 42 | 27.3 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**අය කර ගැනීමට ඇති ණය ශේෂ**

(i) විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ

විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.169,675 ක් වූ වසර 01 ක් ඉක්මවූ ණය ශේෂය නිරවුල් කරගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ii) වැඩ තහනම් කළ නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ

2017 දෙසැම්බර් 31 දිනට වැඩ තහනමට ලක්වූ නිලධාරීන් තිදෙනෙකුගෙන් රු.130,178 ක ණය ශේෂයක් අයවීමට තිබුණු අතර ඉන් රු.55,318 ක් වූ වසර 05 ඉක්මවූ ණය ශේෂයක් හා වසර 01 ක් ඉක්මවූ රු.9,500 ක් වූ ණය ශේෂයක් විය. මෙම ණය ශේෂයන් 2018 සැප්තැම්බර් 30 දින වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(iii) සේවය හැරගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ

දෙපාර්තමේන්තුවේ සේවය හැර ගිය නිලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.567,853 ක ශේෂයක් පැවති අතර ඉන් වසර 03 සිට 05 දක්වා කාලය ඉක්මවූ රු.480,072 ක ණය ශේෂයක් පැවතුනි එම ණය ශේෂ 2018 සැප්තැම්බර් 30 දින වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

## 2.5 වාණිජ අත්තිකාරම් ගිණුම

විෂය අංක 21302 දරන පොත් මුද්‍රණය, ප්‍රචාරණය සහ අලෙවියට අදාළ වාණිජ අත්තිකාරම් කාර්යය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව එහි මූල්‍ය ප්‍රතිඵල පහත පරිදි විය.

| **අත්තිකාරම් ගිණුම් කටයුත්ත** | **මූල්‍ය ප්‍රතිඵල** | | | |
|---|---|---|---|---|
| | **2017** | | **2016** | |
| | **ලාභය කල්පිත ගාස්තු රහිතව** | **(පාඩුව) කල්පිත ගාස්තු සහිතව** | **ලාභය කල්පිත ගාස්තු රහිතව** | **ලාභය කල්පිත ගාස්තු සහිතව** |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| පොත් මුද්‍රණය ප්‍රචාරණය අලෙවිය | 674.4 | (6,473) | 343.5 | 1,095.4 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය සඳහා වූ අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් විගණන මතයක් ප්‍රකාශ කළ නොහැකි අතර ඉකුත් වර්ෂවල ගිණුම් සම්බන්ධයෙන්ද විගණන මතයක් ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) 2017 ජනවාරි 01 දිනට උපචිත වියදම් ගිණුමේ දැක්වුණු රු.36,021,961 ක ආරම්භක ශේෂය වර්ෂයේ වියදම්වලින් අඩුකර දක්වා තිබුණි.

(ඇ) පොත් මුද්‍රණයේදී පිටු අඩු වැඩි වීම් වෙනුවෙන් ගෙවූ රු.36,505,028 ක වියදම් ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස දක්වා තිබුණි.

(ඈ) ණය හිමි ගිණුමේ ඇතිවී තිබූ රු.45,311,159 ක වෙනස අනුමත අත්තිකාරම් ගිණුමට මාරුකර දක්වා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඉ) වර්ෂය තුල ගොඩනැගිලි කුලී මුදල් වෙනුවෙන් රු.6,337,676 ක් ගෙවීම්කර තිබුණු අතර ඒ තුල 2016 වර්ෂයට අදාළ ගොඩනැගිලි කුලී මුදල් වූ රු.540,599 ක්ද ඇතුළත්ව තිබුණි. තවද 2017 වර්ෂය වෙනුවෙන් රු.136,143 ක හිඟ කුලී මුදල් ගිණුම්වල දක්වා නොතිබුණි.

(ඊ) මුද්‍රණ ණයහිමි ආරම්භක ශේෂය රු.1,498,258,670 ක් වූ අතර රු.21,869,370 ක් වටිනා ගිවිසුම් අවලංගු කර තිබුණද ඒ සඳහා ගැලපීම් සිදුකර නොතිබුණි.

(උ) 2017 වර්ෂයේ මුද්‍රණ ණයහිමි ආරම්භක ශේෂය තුල වූ රු.43,587,570 ක් 2017 වර්ෂයේ නිරවුල් කර නොතිබුණු අතර වර්ෂය අවසානයේ මුද්‍රණ ණයහිමි ශේෂය තුලද දක්වා නොතිබුණි.

(ඌ) දෙපාර්තමේන්තුවේ පොත් අලෙවි හල් හා ගබඩා පවත්වාගැනීම වෙනුවෙන් කොළඹ කොටුව හා ඔරුගොඩවත්ත ගබඩා සඳහා තබා තිබුණු රු.946,150 ක ගබඩා තැන්පතුව ශේෂ පත්‍රයේ රු.625,000 ක් ලෙස රු.321,150 ක් අඩුවෙන් දක්වා තිබුණි. එසේම 2017 ජූනි 30 දිනෙන් දෙපාර්තමේන්තුව ගබඩාකිරීම් අවසන් වුවද ඔරුගොඩවත්ත ගබඩාව සඳහා වූ රු.853,000 ක තැන්පතු මුදල විගණිත දිනය වූ 2018 ජූනි 30 දක්වාම අයකරගෙන නොතිබුණි.

(එ) ලාභාලාභ ගිණුමේ ශුද්ධ ලාභය විසර්ජන ගිණුමේ සඳහන් කර තවදුරටත් වියදම් විසර්ජනය කිරීමකින් පසුව ඉතිරි ශේෂය ශේෂ පත්‍රයේ ඇතුළත් කළ යුතු වුවද ශුද්ධ ලාභයත් සටහන් කර මෙම විසර්ජන ගිණුමේ පෙර වර්ෂයේ ඉදිරියට ගෙන ආ රු.7,845,247,957 ක ශේෂයක් විසර්ජනය සඳහා යොදාගෙන තිබුණු නමුත් එම ගිණුමින් ඉතිරි ශේෂයක් ශේෂ පත්‍රයටද ගෙනවිත් නොතිබුණි.

(ඒ) සෙමෙන් විකුණන පොත්වලින් සිදුවිය හැකි පාඩු සඳහා වාර්ෂික ලාභයෙන් වෙන්කර තිබුණු රු.3,733,972 ක හා භාවිතයෙන් ඉවත් කළ පොත් තොග ගිණුම සඳහා

වෙන්කරන ලද රු.58,703,933 ක් වූ ශේෂයන් ලාභා අලාභ ගිණුමට ගැලපීම් කර නොතිබුණි.

(ඔ) මුද්‍රණකරුවන් වෙත ගෙවීම්කිරීමේ ලේඛනය අනුව 12 ශ්‍රේණිය දෙමළ මාධ්‍ය ඉස්ලාම් ශිෂ්‍යාචාරය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පිටපත් මුද්‍රණයකිරීම සඳහා පුද්ගලික සමාගමක් සමග රු.122,000 ක් වූ ගිවිසුමකට එළඹ තිබුණි. පසුව එය රු.97,000 ක් ලෙස වෙනස්කර තිබුණද ගිණුමේ රු.122,000 ක ණය හිමි ශේෂයක් දක්වා තිබුණි.

(ඕ) පුද්ගලික සමාගමකින් 2009 වර්ෂයේ සිට ලැබිය යුතුව පැවති රු.7,431,012 ක් සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ක) වාර්ෂිකව මුද්‍රණය කර අධ්‍යාපන අමාත්‍යාංශයට අලෙවි කරන පොත් වටිනාකම ණයගැතියන් ලෙස වැරදියට සටහන් කිරීම හේතුවෙන් 2010 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.2,954,000,000 ක් වූ ණයගැති ශේෂය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ච) 1993 සිට 2002 වර්ෂය දක්වා කාලය තුල රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත ලබාදී තිබුණු පොත් වෙනුවෙන් අයකර ගත යුතුව තිබුණු රු.110,304 ක මුදල අයකරගැනීමට නොහැකි වී තිබුණි.

(ට) ගිවිසුම් ගත මුදල වූ රු.125,410,405 ක් වටිනා ගුරු මාර්ගෝපදේශ හා පෙළපොත් වර්ග 45 ක් මුද්‍රණය කර 2018 ජනවාරි මස අවසානයට පෙරහාරදිය යුතු වුවද 2018 ජූනි 30 දක්වාම එම පොත් මුද්‍රණය කර භාර දී නොතිබුණි.

## 2.6 අනුකූල නොවීම

-----------------

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 396 (ඇ) | 620,831 | ගිණුම් 02 කට අදාළව නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ මාස 06 ක් ඉක්මවූ චෙක්පත් 39 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 510 (2) (ආ) | 2,997,188,104 | 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ දෙපාර්තමේන්තුවේ ලාභාලාභ ගිණුමේ ලාභය රජයේ අදායමට පැවරීමට කටයුතු කර නොතිබුණි. |

**2.7 මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 35.6 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.110,216 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 45 | 35 | 10 | - |
| (ii) | තෘතියික මට්ටම | 04 | 02 | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 120 | 87 | 33 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 73 | 156 | - | 83 |
| (v) | අනියම්/කොන්ත්‍රාත් | - | 43 | - | 43 |
| | එකතුව | 242 | 323 | 45 | 126 |

විධිමත් අනුමැතියකින් තොරව අනුමත සංඛ්‍යාව ඉක්මවා සේවකයින් 126 ක් බඳවාගෙන තිබුණි.